# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,122- 2019 මැයි මස 03 වැනි සිකුරාදා - 2019.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි) තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2019 මැයි මස 17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

1. *වැටුප් පරිමාණය :*

   2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.47,340 -3 x 755/13 x 1,030 - 62,995 /- වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු 37,558 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලු අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 75,000 පමණ වේ.)

2. *වයස් සීමාව :*

   අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :*

   පහත සඳහන් (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් කවර ආකාරයකට හෝ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති අයදුම්කරුවන් හට ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්කළ හැකිය.

   (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් වෙතින් උපාධියක් ලබා තිබීම (දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා තිබිය යුතුය) සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාවට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

   හෝ

   (ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම හෝ නව නිර්දේශය යටතේ එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම සහ දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දෙක සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථ ලබා තිබීම;

   සහ

   දෙමළ / ඉංග්‍රීසි භාෂාවට අදාළව ගුරු වෘත්තීය හෝ කථා පරිවර්තනය හෝ භාෂා පරිවර්තනය හෝ ජන සන්නිවේදනය වැනි ක්ෂේත්‍රයක වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

   හෝ

   (ඇ) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙමළ / ඉංග්‍රීසි කථා පරිවර්තක හෝ භාෂා පරිවර්තක ස්ථිර තනතුරක් දරන අයෙකු වීම සහ එම තනතුරේ වසර 5 ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

   ක්ෂණික කථා පරිවර්තන හා භාෂා පරිවර්තනය පිළිබඳ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

   සටහන .- ඉහත 3 (අ), (ආ) හෝ (ඇ) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවටත් සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වන අතර සමගාමී කථා පරිවර්තනය පිළිබඳ සේවා පළපුරුද්දක් අත්‍යාවශ්‍ය නොවේ.

5. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි*

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මුලින්ම වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, සේවයෙහි ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

   (ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතු ය.

   (iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

   (අ) උප්පැන්න සහතිකය,
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

__________,
ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2019 මැයි මස 03 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම්පත

***පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි) තනතුර***

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
    (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
    (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss.) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

    දුරකථන අංකය : | | | | | | | | | | |

    (ආ) කාර්යාලයීය ලිපිනය :————.

    දුරකථන අංකය : | | | | | | | | | | |

    (ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය :

    පෞද්ගලික : [    ]     කාර්යාලයීය : [    ]

04. (අ) උපන් දිනය :————.
    (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

    (ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

දැන්වීමෙහි 3 (අ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සඳහා -

| උපාධිය සම්බන්ධ විස්තර | | | |
|---|---|---|---|
| උපාධි නාමය | විෂයයන් | විශ්වවිද්‍යාලය | සමත් වූ වර්ෂය |
| | | | |
| | | | |
| | | | |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

| අ. පො. ස (සා/පෙළ) | | |
|---|---|---|
| විෂයය | සාමාර්ථය | වර්ෂය |
| ඉංග්‍රීසි/දෙමළ | | |

දැන්වීමෙහි 3 (ආ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සඳහා -

| අ.පො.ස (උ/පෙළ) | | |
|---|---|---|
| විෂයය | සාමාර්ථය | වර්ෂය |
| | | |
| | | |
| | | |
| | | |

| අ. පො. ස (සා/පෙළ) | | |
|---|---|---|
| විෂයය | සාමාර්ථය | වර්ෂය |
| දෙමළ | | |
| ඉංග්‍රීසි | | |

| පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) | | |
|---|---|---|
| ආයතනය | තනතුර | සේවා කාලය |
| | | |

දැන්වීමෙහි 3 (ඇ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සඳහා -

| පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) | | |
|---|---|---|
| ආයතනය | තනතුර | සේවා කාලය |
| | | |

9. වෘත්තීය සුදුසුකම් :- ........................................................................................................
........................................................................................................
........................................................................................................

10. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :——————.
(ආ) මුල් පත්වීමේ දිනය :——————.
(ඇ) දැනට දරන තනතුර :——————.
(ඈ) මාසික මූලික වැටුප :——————.
(ඉ) දීමනා :——————.
(ඊ) දළ වැටුප :——————.

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
........................................................................................................

12. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
........................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

__________,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ..................... තනතුර දරන ...................................................................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

__________,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :——————.

05-192

---

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

වාහන විදුලි ශිල්පී තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින "වාහන විදුලි ශිල්පී" තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2019 මැයි මස 17 දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "වාහන විදුලි ශිල්පී" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

1. *වැටුප් පරිමාණය* :

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.30,350-11 x 330/10 x 380- රු. 37,780 /- වේ. එබැවින්, තෝරාගන්නා අයදුම්කරුවන් පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 27,214 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 57,000.00 පමණ වේ).

2. *අධ්‍යාපන සුදුසුකම්* :

සිංහල/දෙමළ, ගණිතය/ අංක ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් සමග සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වී සිටීම.

3. *වෘත්තීය සුදුසුකම්* :

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් මෝටර් රථ විදුලි කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ Level 4 හෝ ඉහල මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

*හෝ*

ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මගින් පවත්වනු ලබන වාහන විදුලි ශිල්පය පිළිබඳ පූර්ණ කාලීන පාඨමාලාව හදාරා තිබීම.

4. *පළපුරුද්ද* :

රජයේ හෝ පිළිගත් ආයතනයක මෝටර් රථ විදුලි කාර්මික ක්ෂේත්‍රයේ වසර 5 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

5. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයන් මගිනි.

7. *සේවා නියමයන් හා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂන තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

10. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2019 මැයි මස 03 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

*ආදර්ශ අයදුම්පත්‍රය*

*වාහන විදුලි ශිල්පී තනතුර*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :——————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :——————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss.) :——————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

03. (අ) පෞද්ගලික ලිපිනය :——————.

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(ආ) කාර්යාලයීය ලිපිනය :——————.

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය :

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (i) උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :——————. මාස :——————. දින :——————.

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථයන් | සමත් වූ වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස (සා.පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් :-(සහතික පිටපත් ඇමිණිය යුතුය)
...........................................................................................
...........................................................................................
...........................................................................................

10. පළපුරුද්ද :-(සහතික පිටපත් ඇමිණිය යුතුය)
...........................................................................................
...........................................................................................
...........................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :

(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) දැනට දරන තනතුර :————.
(ඇ) මුල් පත්වීමේ දිනය :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :
...........................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :
...........................................................................................

මවිසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**දෙපාර්තමේන්තුව/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ .................... තනතුර දරන ...................................................මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.

05-193

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජුනි මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 අප්‍රේල් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතලේ | රත්තොට | උඩසිය පත්තුව උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මාතලේ දකුණ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

05-58

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජුනි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| රත්නපුර | රත්නපුර | බඹරබොටුව කොට්ඨාසයේ උප්පැන්න මරණ හා නවදුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | රත්නපුර | ගිලීමලේ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | කොලොන්න | කොලොන්න කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | රත්නපුර | කුරුවිට කෝරළය (රත්නපුර නගර) කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | රත්නපුර | ගිලීමලේ උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | ඉඹුල්පේ | මද්දේගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කඩවත හා මැද කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

05-60

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන්ගේ අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජුනි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| රත්නපුර | බලංගොඩ | බලංගොඩ කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |
| රත්නපුර | ඇහැලියගොඩ | රත්නපුර කොට්ඨාසයේ කැන්දගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

05-59

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

කර්මාන්ත හා වානිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ
පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත්කර ගැනීම - 2019 වර්ෂය**

2019 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (*අ*) වයස : 2019.03.31 වැනි දිනට අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතු ය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :
අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම;

*හෝ*

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත්වීම.

*විශේෂ කුසලතා* :

විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් ය.

(*ඇ*) *සැ. යු.*—ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතු ය.

2. *පාඨමාලා මාධ්‍යය* :

මෙහි දක්වෙන සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ. තව ද සිංහල භාෂාවේ ප්‍රවීනත්වය මත මෝටර් කාර්මික ශිල්පය හැර අනෙකුත් පාඨමාලා හැදෑරීම පිණිස ද්‍රවිඩ මාධ්‍ය ආධුනිකයින්ට ද අවස්ථාව හිමිවේ. ඉහත (ආ) හි ලන්ඩන් සාමාන්‍ය පෙළ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්කරන්නන්ට සිංහල/දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා හැදෑරීමට හැකියාව තිබිය යුතු ය.

3. *ඇතුළත් කරගැනීමේ පරීක්ෂණය.*—අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(*අ*) *පවත්වන මාධ්‍යය.*—සිංහල/දෙමළ

(*ආ*) *විභාග මධ්‍යස්ථාන.*—කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ වවුනියාව (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගේ කැමැත්ත මත වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.)

*විභාගයට අදාළ විෂයයන්.*—ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, ඉංග්‍රීසි භාෂා දැනුම සහ, කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු.*—විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.
***ගිණුම.****—ගණකාධිකාරි*, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක : 681490.

විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. *මූලික තෝරාගැනීම* :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. *අවසන් තෝරා ගැනීම* :

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතු ය.

7. *පුහුණු පාඨමාලා* :

| *අනු. අංකය* | *පාඨමාලාව* | *කාලසීමාව* |
|---|---|---|
| 01 | මෝටර් කාර්මික ශිල්පය | - අවු. 04 |
| 02 | මිල්රයිට් වැද්දුම් ශිල්පය | - අවු. 04 |
| 03 | වායුසමීකරණ/ශීතකරණ ශිල්පය | - අවු. 03 1/2 |
| 04 | බල විදුලි ශිල්පය | - අවු. 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පය | - අවු. 03 1/2 |
| 06 | මෙකාට්‍රොනික් (කර්මාන්ත ගත) ශිල්පය | - අවු. 03 1/2 |
| 07 | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - අවු. 03 |
| 08 | වාහන විදුලි ශිල්පය | - අවු. 03 |
| 09 | පැස්සුම් ශිල්පය | - අවු. 03 |
| 10 | වාහන වායුසමීකරණ ශිල්පය | - අවු. 03 |
| 11 | මෝටර් වාහන, බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පය | - අවු. 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවන් අනුව ය.

8. *ගිවිසුම් අත්සන් කිරීම* :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු. 04, 03 1/2 සහ 03ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

9. *අයදුම්පත්* :

පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවීම අනිවාර්ය වේ :-

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) අධ්‍යාපන සහතික;

(*ඇ*) ඉහත අංක 1 හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය,

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2019" යනුවෙන් සඳහන් කළ යුතු ය.

*අයදුම්පත් ලබා ගැනීම* :

- අයදුම්පත් www. cgtti.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන්,
- ආයතනයට පැමිණීමෙන්,
- නම හා ලිපිනය සඳහන් මුද්දර සහිත ලියුම් කවරයක් එවීමෙන් ලබා ගත හැක.

2019.05.03 දිනැති රජයේ *ගැසට්* පත්‍රයේ ද ආදර්ශ අයදුම්පත පළ කර ඇත.

10. *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය* :

අයදුම්පත් 2019.06.21 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - පරිපාලන හා මානව සම්පත් වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

11. *විභාග ප්‍රවේශපත්‍ර* :

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර 2019.08.10 දින වන විට ලැබීමට සලස්වන අතර, ඒ වන විටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 14ක් ඇතුළත පහත දුරකථන අංකයෙන් විමසිය යුතු ය.

අජිත් අබේගුණවර්ධන,
කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්,
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය.

අංක 582, ගාලු පාර,
ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 011-2605625.

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

***ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත්කර ගැනීම - 2019 වර්ෂය***

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | Q | DQ | විභාග අංකය | | | | | | සම්මුඛ පරීක්ෂණ අංකය | | ආධුනික අංකය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

* ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කිරීමේ දී කැපිටල් ඉංග්‍රීසි අකුරු භාවිතා කළ යුතු ය.
* පහත ( * ) සඳහන් ස්ථානයන්හි ( ✓ ) ලකුණ යොදන්න.

01. (*අ*) සම්පූර්ණ නම (සිංහලෙන්)

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්)

(*ඇ*) මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්)

02. (*අ*) තැපැල් ලිපිනය (සිංහලෙන්)

(*ආ*) තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්)

(*ඇ*) දිස්ත්‍රික්කය : (*ඈ*) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : (*ඉ*) පළාත :

(*ඊ*) ඊමේල් ලිපිනය : (*උ*) දුරකථන අංකය : ජංගම / නිවස

03. (*අ*) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය : (*ආ*) 2019.03.31 දිනට වයස : අවු : මාස දින

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : (*ඈ*) ස්ත්‍රී/පුරුෂ (*) : ස්ත්‍රී පුරුෂ

04. අධ්‍යාපන සුදුසුකම් : (අ.පො.ස. සා. පෙළ)-(පළමු වර) දෙවන වර (විශේෂ කුසලතා යටතේ ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණි.)

| *විභාග අංකය* | | *වර්ෂය* | |
|---|---|---|---|
| *විෂයයන්* | | *සාමාර්ථය* | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| *විභාග අංකය* | | *වර්ෂය* | |
|---|---|---|---|
| *විෂයයන්* | | *සාමාර්ථය* | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

05. විශේෂ දක්ෂතා යටතේ අයදුම්කරන්නේ නම්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම මගින් නිකුත්කළ පළාත්/ජාතික මට්ටමේ සහතික නිකුත් කළ වර්ෂය හා ක්ෂේත්‍රය :

වර්ෂය : ක්ෂේත්‍රය :

06. (*අ*) අයදුම්කරු ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති මාධ්‍යය (*) සිංහල දෙමළ

(*ආ*) අයදුම්කරු ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය (*)

| කොළඹ | මහනුවර | ගාල්ල | බදුල්ල | අනුරාධපුරය | වවුනියාව |
|---|---|---|---|---|---|
| | | | | | |

07. (*අ*) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාව : (*ඇ*) දිනය :

08. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| | | | |
|---|---|---|---|
| (අ) බැංකු ලදුපත අමුණා ඇත | ඔව් | නැත | |
| (ආ) අධ්‍යාපන සහතික පිටපත් අමුණා ඇත | ඔව් | නැත | |
| (ඇ) උප්පැන්න සහතිකයේ පිටපත අමුණා ඇත | ඔව් | නැත | |
| (ඈ) අංක 05 යටතේ, විශේෂ දක්ෂතා සහතික අමුණා ඇත | ඔව් | නැත | අදාළ නැත |
| (ඉ) වයස් සීමාව | -16 | OK | 22+ |
| (ඊ) ප්‍රවේශ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා ඇත | ඔව් | නැත | |
| (උ) පරීක්ෂා කළේ | | | |

05-56

---

**රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2019 වර්ෂය**

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2019 වර්ෂය සඳහා ආධුනිකයින්/ආධුනිකාවන් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවම සුදුසුකම් :

*(අ)* වයස.-2019.05.31 දිනට අවුරුදු 16ත් 25ත් අතර විය යුතුය.

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක් ඕනෑම විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.

03. *පුහුණු පාඨමාලා :*

ආධුනික පුහුණුවට තෝරාගනු ලබන ආධුනිකයින්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදළ කාලසීමාවට යටත්ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා ආධුනිකයින් 25 දෙනා බැගින් තෝරා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | අවුරුදු 02 1/2 (N. V. Q. Level 04) |
| (ii) | පැස්සුම් ශිල්පී | අවුරුදු 03 (N. V. Q. Level 04) |
| (iii) | විදුලි ශිල්පී (බල) | අවුරුදු 03 1/2 (N. V. Q. Level 04) |
| (iv) | යන්ත්‍ර ශිල්පී (සාමාන්‍ය) | අවුරුදු 03 1/2 (N. V. Q. Level 04) |

04. *අයදුම්පත් :-*

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව මි. මී. 297 x 210 (A-4) ප්‍රමාණයේ සුදු කඩදසියක පිළියෙළ කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. පාඨමාලා සඳහා තෝරා ගැනීම :

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් සිදුකරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 07 වන ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම හා සාමාන්‍ය දැනීම පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා පදනම යටතේ ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලදී වැඩිම මුළු ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

06. *විභාග මාධ්‍ය :*

විභාග මාධ්‍යයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේ.

07. විභාග ගාස්තු :

මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 500 විභාග ගාස්තුවක් අය කෙරේ. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-2-9027313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවක ගෙවා ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුය) ලදුපත අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතුය.

08. *විභාග මධ්‍යස්ථාන :*

සියලුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ මධ්‍යස්ථානයක දී පමණක් පැවැත්වේ.

09. *ගිවිසුම අත්සන් කිරීම :*

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදළ කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුවෙන් පසු ආධුනිකයින්ට රැකියා ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

11. පහත දක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිළියෙල කර ''නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු හා මානව සම්පත් සංවර්ධන), ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දේමුල්ල පාර, රත්මලාන.'' වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලං. ජ. දු. කා.අ.ම/2019'' යනුවෙන් සඳහන් කළ යුතුය.

12. *අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :*
අයදුම්පත් 2019.05.31 වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය
කොළඹ 10.

**ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2019 වර්ෂය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. නම සම්පූර්ණයෙන් (වාසගම සමග) සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියන්න.
(සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.

02. ලිපිනය
(සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.

03. දිස්ත්‍රික්කය :————.

04. උපන් දිනය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. දුරකථන අංකය :————.

07. අධ්‍යාපන සුදුසුකම් :-

| *අ.පො.ස. (සා/පෙළ) :* *විෂයය* | *විභාග අංකය* :————. *ශ්‍රේණිය* |
|---|---|
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |
| ........................ | ......... |

08. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍ය :————.

09. අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය අනුව තමා කැමති වෘත්තීන් දෙකක් අනුපිළිවෙළින් සඳහන් කරන්න.
1. :————.
2. :————.

10. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන සේ අයදුම්පතට අමුණන්න.

11. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් පෙනී ගියහොත් එයින් නුසුදුස්සකු වීමටත් තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

05-109

---

නිවැරදි කිරීමයි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක (පුහුණු ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019**

2019.04.05 දින පළ කරන ලද අංක 2,118 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 04-442 දරන ඉහත සඳහන් දෙපාර්තමේන්තුවට අයත් නිවේදනයේ 5.5 ඡේදයෙහි (ආ)(2) හි අධ්‍යාපන සුදුසුකම් වැරදි ලෙස මුද්‍රණය වී ඇති හෙයින්, එය පහත පරිදි නිවැරදි විය යුතුයි.

5.5 පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. :-

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයයන් (06)කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(*ආ*) විෂයයන් 03කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම. විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතුය.

(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය

(2) භෞතික විද්‍යාව සමග

(i) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික/සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්,
සහ
(ii) රසායන විද්‍යාව/කෘෂි විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්.

ඒ. කේ. කරුණානායක,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*)

05-239

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## බඩුබාහිරාදිය විකිණීම

**සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය - නාරම්මල**

මෙම අධිකරණයේ ඉදිරියේ පැවති නඩුවලට අදාලව රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2019.05.11 වෙනි දින පෙරවරු 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙරවරු 9.45 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතුය.

03. වෙන්දේසිය පැවැත්වෙන දින පෙරවරු 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබා ගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

04.අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථා වල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු ය.

06. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දීම මුදලින් පමණක් ගෙවීම් කල යුතු ය.

07. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ එදින පස්වරු 3.30 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කල යුතු ය.

පනනි එස්. විජේතුංග,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කුලියාපිටිය.

2019 අප්‍රේල් 10 වැනි දින,
කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වැලි

| අයිතම අංක | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 60683 | වැලි කියුබ් | 01 |
| 02. | 60366 | වැලි කියුබ් | 03 |
| 03. | 59400 | වැලි කියුබ් | 03 |
| 04. | 59116 | වැලි කියුබ් | 01 |
| 05. | 58023 | වැලි කියුබ් | 03 |
| 06. | 58022 | වැලි කියුබ් | 03 |
| 07. | 56882 | වැලි කියුබ් | 02 |
| 08. | 56877 | වැලි කියුබ් | 01 |
| 09. | 54824 | වැලි කියුබ් | 03 |
| 10. | 53288 | වැලි කියුබ් | 01 |

මුළු ප්‍රමාණය : වැලි කියුබ් 21

**පස්**

| | | | |
|---|---|---|---|
| 11. | 60314 | පස් කියුබ් | 03 |
| 12 | 60313 | පස් කියුබ් | 03 |
| 13 | 59401 | පස් කියුබ් | 03 |

මුළු ප්‍රමාණය : පස් කියුබ් 09

**බොරළු**

| | | | |
|---|---|---|---|
| 14. | 60317 | බොරළු කියුබ් | 03 |
| 15. | 60327 | බොරළු කියුබ් | 03 |
| 16. | 59119 | බොරළු කියුබ් | 03 |
| 17. | 59120 | බොරළු කියුබ් | 03 |
| 18. | 59118 | බොරළු කියුබ් | 01 |
| 19. | 59115 | බොරළු කියුබ් | 01 |
| 20. | 59117 | බොරළු කියුබ් | 03 |
| 21. | 58049 | බොරළු කියුබ් | 02 |
| 22. | 57316 | බොරළු කියුබ් | 03 |
| 23 | 56880 | බොරළු කියුබ් | 01 |
| 24 | 54825 | බොරළු කියුබ් | 02 |
| 25. | 54826 | බොරළු කියුබ් | 03 |
| 26. | 54824 | බොරළු කියුබ් | 03 |
| 27. | 54426 | බොරළු කියුබ් | 03 |
| 28. | 53751 | බොරළු කියුබ් | 03 |
| 29. | 53754 | බොරළු කියුබ් | 03 |
| 30. | 53290 | බොරළු කියුබ් | 03 |
| 31. | 53291 | බොරළු කියුබ් | 02 |
| 32. | 52204 | බොරළු කියුබ් | 03 |

මුළු ප්‍රමාණය බොරළු කියුබ් 48

05-197

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : ARA/ADM/ADMIN/6/7/5.
2019.04.11

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2019/2020 වර්ෂය

**2019 ජූලි සිට 2020 ජුනි දක්වා**

2019 ජූලි මස 01 දින සිට 2020 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල පරිමාණයෙන් යටත් පිරිසයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි අංක............. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුම් නම සහ අංකය සඳහන් කොට 2019.05.21 වන දින පෙ.ව. 10.30 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

5. 2019.05.21 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2019.06.12 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

2019 අප්‍රේල් මස 11 වැනි දින.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් කල යුතු මුදල රු.* |
|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | ආරච්චිකට්ටුව | 11 | 2019.05.21 පෙ.ව. 10.30 | 1,000 |
| ආරච්චිකට්ටුව | බත්තුළුඔය | 12 | 2019.05.21 පෙ.ව. 10.30 | 1,000 |

05-16

**මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - (2019/2020 වර්ෂය) 2019 ජූලි මස 01 සිට 2020 ජුනි මස 30 දක්වා කාලය සඳහා - මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2019 ජූලි මස 01 වැනි දින සිට 2020 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ අංක.................................. දරන....................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2019.05.29 වැනි දින පෙ.ව. 10.30 ට පෙර මුන්දලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2019.05.29 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2019.06.20 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032-2052271).

ජේ. ඒ. විජානි වසන්තිකා ,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2019 අප්‍රේල් මස 10 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ශත* |
|---|---|---|---|---|---|---|---|
| 01. | මුන්දලම | මුන්දලම | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2019.05.29 පෙ.ව. 10.30 | 1,000 | 0 |
| 02. | මුන්දලම | මදුරන්කුලිය | පෙ.ව.11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2019.05.29 පෙ.ව.10.30 | 1,000 | 0 |
| 03. | මුන්දලම | මුක්කුතොඩුවාව | පෙ.ව. 11.00 ප.ව.5.00 | ප.ව.2.00 ප.ව.8.00 | 2019.05.29 පෙ.ව.10.30 | 1,000 | 0 |
| 04. | මුන්දලම | උඩප්පුව | පෙ.ව.11.00 ප.ව.5.00 | ප.ව.2.00 ප.ව.8.00 | 2019.05.29 පෙ.ව.10.30 | 1,000 | 0 |

05-57

---

# රජයේ නිවේදන

**දැන්වීමයි**

දැනට ඈවර වෙමින් පවතින සී/ස ඔකඳ ෆිනෑන්ස්හි ණයහිමියන් වෙත කෙරෙන නිවේදනයයි

**බස්නාහිර පළාත්බද මහාධිකරණ නඩු අංක : එච් සී/සිවිල්/25/2009/සී ඕ හිමිකම් පෑමේ අවසාන දිනය පිළිබඳ දැන්වීමයි**

සීමාසහිත ඔකඳ ෆිනෑන්ස් සමාගමේ තම ණය හිමිකම් මෙතෙක් ඉදිරිපත් නොකරන ලද ණය හිමියන් වර්ෂ 2009.05.22 දිනට ස්වකීය හිමිකම් වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ විධි විධාන ප්‍රකාරව 2019 මැයි මස 31 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් නඩු අංක යටතේ ගරු අධිකරණය විසින් පත්කරන ලද ඈවරකරුවන් වෙත ලැබීමට සලස්වන මෙන් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ණය හිමියන් ස්වකීය හිමිකම්පෑම් දිවුරුම් ප්‍රකාශයක් මගින් එයට අදාළ ණය ගිවිසුම හෝ සමාගම විසින් නිකුත් කරන ලද අනෙකුත් නීත්‍යානුකූල ලියකියවිලි සහ ණය හිමියාගේ ජාතික හැඳුනුම්පත යන මේවායේ සහතික පිටපත් සමග සම්බන්ධ කළ හැකි ලිපිනය සහ දුරකථන අංක අප වෙත යොමු කළ යුතු ය.

ණයහිමියා මියගොස් ඇත්නම් නීත්‍යානුකූල උරුමකරු පත්කිරීමේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයේ සහතික පිටපතක් සහ අදාල අනෙකුත් ලියකියවිලි අප වෙත එවිය යුතු ය. ඔබගේ ණය හිමිකම් අයදුම්පත පරීක්ෂා කිරීමෙන් පසු පිළිග නු ලැබේ.

ඔබගේ ඉල්ලුම්පත වර්ෂ 2019 මැයි මස 31 දිනට හෝ ඊට පෙර ඈවරකරුවන් වෙත ලැබීමට සැලැස්විය යුතු ය. පිළිගත් අයදුම්පත් සඳහා ගෙවීම් කරනු ලබන්නේ සමාගම සතු ශුද්ධ වත්කම් ශේෂය මත වන අතර එය සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව සහ අධිකරණයේ අවසරය මත සිදු කරනු ලැබේ.

වර්ෂ 2019 මැයි මස 31 දිනට පසුව ලැබෙන හිමිකම්පෑමේ ඉල්ලුම්පත් ඉහත ගෙවීම් සඳහා අප විසින් සලකා බලනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍යනම් පහත දුරකතන අංකය ඇමතීමෙන් හෝ සතියේ දිනවල පෙ. ව. 9.30 සිට ප. ව. 3.30 දක්වා පැමිණ ලබාගත හැක.

සී/ස ඔකඳ ෆිනෑන්ස්,
ඈවරකරුවෝ.

අංක 11(3 වන මහල), කාසල් පටුමග, කොළඹ 04
දුරකථන අංකය : 011- 5444420.

05-18

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගමේ නාමය : යුන්ඩා එක්ස්ප්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00209324
ලියාපදිංචි ලිපිනය : අංක 169ඒ, ගාලු පාර, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2019.02.27

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-34

---

**ඇටෝනි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, කටුවන, කුලසිරි කුමාරගේ මාවතේ අංක 282/6ඒ දරන ස්ථානයේ පදිංචි සෙනරත් මුදලිගේ දොන් ඇලෙක්සිස් විනීත ජයතිලක වෙත ප්‍රදානය කරන ලද 2013 මාර්තු මස 28 වැනි දින දරන ඇටෝර්නි බලය 2019 මාර්තු මස 4 වැනි දින සිට බල පවත්වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර, අවලංගු කර සහ නිශ්ප්‍රභ කරන බව එක්සත් රාජධානියේ LU6 2DL ඩන්ස්ටබිල් ඊටන් බේ, 2 හයි ස්ට්‍රීට්, චර්ච් ෆාම් යන ලිපිනයේ දැනට පදිංචිව සිටින්නාවූ ඩෙලවෙයාර්හි නිසි පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වූ ද ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 251 ලිට්ල් ෆෝල්ස් ඩ්‍රයිව්, විල්මින්ටන් DE 19808 දරන ස්ථානයේ පිහිටියාවූ ද එහි ශාඛා කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ හිල්ටන්, අංක 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, තැ. පෙ. 100, කොළඹ යන ලිපිනයේ පිහිටියාවූ ද හිල්ටන් ඉන්ටනැෂනල් මැනේජ්මන්ට් LLC Hilton International Management LLC) ආයතනයේ එකම සාමාජිකයා වන හිල්ටන් වර්ල්ඩ් වයිඩ් මැනේජ් ලිමිටඩ්, Hilton Worldwide Manage Limited) හි අධ්‍යක්ෂකවරයකු වන බ්‍රයන් විල්සන් වන මම ශ්‍රී ලංකාවේ ජනතාවට හා ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

බ්‍රයන් විල්සන්.

05-69

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 පෙබරවාරි මස 18 වැනි දින සංස්ථාගත කරන ලදී.

නම : ස්මාර්ට් මෙට්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පීවී 00208958
ලිපිනය : අංක 114, අලවතුපිටිය, සීදූව.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

හෙට්ටිආරච්චිගේ නිරෝෂා දිල්රුක්ෂි,
ලේකම්.

05-75

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

මහරගම නාවින්න හයිලෙවල් පාර අංක 310 ලිපිනයැති රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් ලිමිටඩ් (පීබී 844) ආයතනයේ අධ්‍යක්ෂවරුන් වන සුනිල් ශාන්ත ගෝඨාභය ලියනගේ හා වර්ණකුලපටබැඳිගේ ජෝසප් විවිල් ප්‍රසිඩස් පෙරේරා වන අප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාවට කියා සිටින්නේ රත්මලාන සිරිමල් උයන අසෝක මාවතේ අංක 29 බී ලිපිනයේ පදිංචි බෝදියාබඳුගේ ෂිරොන් ඒඩ්‍රියන් පෙරේරා (ජා. හැ. අංක 662510700 වී) යන අය රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් ලිමිටඩ් ආයතනයේ ඇටෝර්නි බලකරුවකු ලෙස පත්කරමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. කේ. කේ. වීරසේකර විසින් ලියා සහතික කළ බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙලුම 269 පත්ඉරුව 20 දිනපොත් අංකය 4930 යටතේ ලියාපදිංචි කර ඇති අංක 562 හා 2019.03.25 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2019.03.29 දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කොට බලරහිත කරනු ලැබ ඇත.

සුනිල් ශාන්ත ගෝඨාභය ලියනගේ
වර්නකුලපටබැඳිගේ ජෝසප් විවිල් ප්‍රසිඩස් පෙරේරා.

05-198

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

සෙන්හිරු මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0050 1000 6777.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් කෝටි අසූ නම ලක්ෂ තිස්තුන් දහස් පනස් එකයි ශත අසූ එකක (රු. 38,933,051.81) මුදල ද, 2019 ජනවාරි මස 19 වැනි දින අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හැත්තෑ පන් ලක්ෂයක (රු. 37,500,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.24 වැනි දින පෙ. ව. 11.00ට ගාලු පාර, මහ පයාගල පිහිටි දේපළ ද හා ප. ව. 12.00 ට ශ්‍රී ඉන්ද්‍රසාර හිමි මාවත දෙඩංගොඩ පිහිටි දේපළ ද, පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ දකුණ පයියාගල් බැද්ද බේරුවල ප්‍රාදේශීය සභා සමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහ පයියාගල අංක 735 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහ පයියාගල පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 66 දරන "දලදාවත්ත හි දකුණු බෙදූ අර්ධ කොටසෙහි ලොට් 1 සහ 4" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. එම්. එම්. ද සිල්වා අය විසින් සාදන ලද 2016 පෙබරවාරි මස 29 දාතම හා අංක 2685 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ උතුරු බෙදූ අර්ධ කොටස, නැගෙනහිරට : දුම්මලමෝදර ඇළ සහ කනත්තේවත්ත නොහොත් ලියනවත්ත, දකුණට : කනත්තේවත්ත නොහොත් ලියනවත්ත සහ බස්නාහිරට : කොළඹ - ගාල්ල ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහසයයි දශම පහයි බිංදුවක් (A:0, R:2, P:16.50) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2685 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව D 61/123 යටතේ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3380 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළේ බටහිර ඉද්දගොඩ පත්තුවේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ දොඩන්ගොඩ, අංක 800 C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දොඩන්ගොඩ බටහිර පිහිටි "තෙලර්ෂන් එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. සමරනායක යන අය විසින් සාදන ලද 2010 ඔක්තෝබර් මස 31 දාතම හා අංක 150C දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 150 දරන පිඹුරේ P P 16785 හි ලොට් 3, නැගෙනහිරට : මෙහි ලොට් 3B, දකුණට : පාර සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හයයි දශම අටක් (A:0, R:1, P:26.8) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 150C දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 144/25 යටතේ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී දොඩන්ගොඩ බටහිර පිහිටි "තෙලර්ෂන් එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ටී. සමරනායක යන අය විසින් සාදන ලද 2010 ඔක්තෝබර් මස 31 දාතම හා අංක 150C දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 150 දරන පිඹුරේ PP 16785 හි ලොට් 3, නැගෙනහිරට : අංක 150B දරන පිඹුරේ ලොට් 4, දකුණට : පාර සහ බස්නාහිරට : මෙහි ලොට් 3A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතරයි දශම දෙකක් (A:0, R:1, P:34.2) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 150C දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 144/26 යටතේ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානකතැන ටී. සමරනායක අය විසින් සාදන ලද 2000 ජූලි 25 සහ 30 දාතම හා අංක 150 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන්කිරීම දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 3382 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-64/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

රෝ - පා කන්ස්ට්‍රක්ශන් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0004 1002 1471.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි තිස් අට ලක්ෂ අසූ පන් දහස් හයසිය හතලිස් දෙකයි ශත තිස් අටක (රු. 13,885,642.38) මුදල ද, 2019 ජනවාරි මස 24 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි විසි පන් ලක්ෂයක (රු. 12,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.23 වැනි දින පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඉහළ බෝමිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉහළ බෝමිරිය පිහිටි "ජම්බුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. ටී. අබේසිංහ යන අය විසින් සාදන ලද 2012 මැයි මස 02 දාතම හා අංක 2068 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලණි ගඟ, නැගෙනහිරට : ලක්ෂ්මන් සේනාතිලකගේ ඉඩම, දකුණට : කැරගල මාවත සහ බස්නාහිරට : ඩී. ඩී. ජූසේ අප්පුහාමිගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි නමයයි දශම දෙකයි පහක් (A:0, R:1, P:29.25) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2068 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 1446/06 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 64/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එල්. ඩී. එච්. හසිකා සහ කේ. මතිවත්තනන්.
ගිණුම් අංක : 0193 5000 9984.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හය කෝටි හැට හත් ලක්ෂ තිස් දහස් හාරසිය අනූවයි ශත පනහක (රු. 66,730,490.50) මුදල ද, 2019 ජනවාරි මස 24 වැනි දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි විසි තුන් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 62,375,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් එකොළොස් ලක්ෂ පනස් හත් දහසක (රු. 1,157,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.23 වැනි දින ප. ව. 2.00ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පලලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නුගේගොඩ අංක 519B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නුගේගොඩ පිහිටි "මාදංගහවත්ත නොහොත් පැලන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. වී. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද 2010 ජූලි මස 11 දාතම හා අංක 4244 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නාවල පාර වරිපනම් අංක 123 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : නාවල පාර, වරිපනම් අංක 113/6 දරන පරිශ්‍රයන් (අංක 860 දරන පිඹුරේ ලොට් 2B), දකුණට : අඩි 10 පළල පාර සහ බස්නාහිරට : පී. එන්සිනා සහ එන්. සුමනාවතී පෙරේරා යන අයගේ ඉඩම (අංක 3785 දරන පිඹුරේ ලොට් 1) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (A:0, R:0, P:12) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4244 දරන පිඹුරට අනුව ය.

අංක 4244 දරන පිඹුරේ එකී ලොට් 2A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී නුගේගොඩ පිහිටි "මාදංගවත්ත නොහොත් පැලන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එල්. බී. නානායක්කාර යන අය විසින් සාදන ලද 1977 නොවැම්බර් මස 27 දාතම හා අංක 860 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නාවල පාර, වරිපනම් අංක 123 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : ලොට් 2B, දකුණට : පාර සහ බස්නාහිරට : පී. එන්සිනා සහ එන්. සුමනාවතී පෙරේරා යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (A:0, R:0, P:12) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 860 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව A 462/81 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 860 දරන පිඹුරේ නිරූපිත මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 64/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

ධම්මික ගාමන්ට්ස්.
ගිණුම් අංක : 0202 1000 2503.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් කෝටි නම ලක්ෂ හැත්තෑ හය දහස් නමසිය පනස් හයයි ශත පනස් හයක (රු. 30,976,956.56) මුදල ද, 2019 ජනවාරි මස 24 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි අසූ අට ලක්ෂ පස් හත් දහස් හයසිය තිස් තුනයි ශත හැට හතක (රු. 28,857,633.67) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් අට ලක්ෂ දහ නම දහස් දෙසිය තුනයි ශත තිස් නමයක (රු. 819,203.39) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරන වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.23 වැනි දින පෙ. ව. 10.30ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, නවගමුව ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 87 දරන "චන්ද්‍රනගර්වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : එස්. එඩ්මන් සිංඤෝ යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 189/2003 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 1255/07 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 91 දරන "චන්ද්‍රනගර්වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : ලොට් 1 සහ බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 189/2003 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 683/78 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 85/41 දරන "චන්ද්‍රනගර්වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 11 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 12, දකුණට : එම්. කේ. සිරිසේන යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එස්. එඩ්මන් සිංඤෝ යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : ලොට් 1 සහ 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 189/2003 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 810/21 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් R3, R4, R5 සහ R6 යන සියල්ලම ලොට් R2 (මීටර් 9 පළල පාර සඳහා වෙන්කිරීම), ලොට් R1 (අතුරු ගිරිය පාර දිගේ වෙන්කිරීම) දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග සහ එකී අංක 189/2003 දරන පිඹුරේ ලොට් D2 සහ ලොට් D1 වශයෙන් ලකුණුකොට ඇති කාණුව භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 64/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

හෙට්ටිආරච්චි ට්‍රේඩර්ස්.
ගිණුම් අංක : 0039 1000 7792.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි දස ලක්ෂ විසි නම දහස් පනහයි ශත විසි දෙකක (රු. 11,029,050.22) මුදල ද, 2019 පෙබරවාරි මස 08 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි දෙලක්ෂ හැට පන් දහසක (රු. 10,265,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) සහ තවත් රුපියල් හාර ලක්ෂ හතලිස් හතර දහස් හයසියයක (රු. 444,600.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.02 වැනි දින ''දිවයින'', ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.27 වැනි දින උපලේඛන අංක II පිහිටි දේපළ (උදෑසන 11.30) 2019.05.28 වැනි දින උපලේඛන අංක I පිහිටි දේපළ (උදෑසන 11.30) ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ, මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කොට්ටාව උතුර - අංක 496 C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොට්ටාව ග්‍රාමයේ පිහිටි "දෙල්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන ඒ. ආර්. සිල්වා යන අය විසින් සාදන ලද 2012 නොවැම්බර් මස 09 දාතම හා අංක 4933 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කෙට බෙදාවෙන්කොට ලොට් 19A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 839 දරන පිඹුරේ ලොට් 18, නැගෙනහිරට : හෝකන්දර පාර සහ ට්‍රාන්ස්පෝමර් සඳහා ඉඩම් වෙන්කිරීම, දකුණට : ට්‍රාන්ස්පෝමර් සඳහා ඉඩම් වෙන්කිරීම සහ ජොරානිස් පීරිස් මාවත සහ බස්නාහිරට : ජොරානිස් පීරිස් මාවත සහ අංක 839 දරන පිඹුරේ ලොට් 20 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම තුනයි පහක් (A:0, R:0, P:15.35) හෝ හෙක්ටායර් 0.0388ක් විශාල ඉඩම් කොටස එකී අංක 4933 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව C 140/86 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 19 A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

බලයලත් මානක තැන එම්. ජේ. සේතුංග යන අය විසින් සාදන ලද 1971 පෙබරවාරි මස 20 දාතම හා අංක 839 දරන පිඹුරේ නිරූපිත ප්‍රමාණයෙන් පර්චස් දහසයක් (A:0, R:0, P:16) හෝ හෙක්ටයාර 0.01138 වූ ලොට් 19 වෙළුම/පත්‍ඉරුව C 140/86 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 839 දරන පිඹුරේ නිරූපිත ලොට් 20 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 81 සහ 1854 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මහසෙන්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහසෙන්පුර ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩැස්තර සිතියම් අංක 830077 හි Block අංක 03 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට කැබලි අංක (Parcel) 300 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩම් කැබලි අංක (Parcel) 290, නැගෙනහිරට : ඉඩම් කැබලි අංක (Parcel) 299, 296 සහ 298, දකුණට : ඉඩම් කැබලි අංක (Parcel) 319 සහ 320 සහ බස්නාහිරට : ඉඩම් කැබලි අංක (Parcel) 228 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම හතරයි තුනයි පහයි නමයක් (0.4359 Ha.) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී කැඩස්තර් සිතියම් අංක 830077 ට අනුව හිමිකම් සහතිකපත් අංක 00150022789 යටතේ හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 559, 2490 සහ 2016 මැයි 26 දාතම දරන හිමිකම් සහතිකපත් අංක 00150022789 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 64/5

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එල්. එච්. එච්. එම්. ද සිල්වා ඒ ඩබ්ලිව්. ඒ. ටී. ඩී. අබේසේකර.
ගිණුම් අංක : 0129 5000 5082.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දසකෝටි තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය විසි හයයි ශත විසි එකක (රු. 10,377,126.21) මුදල ද, 2019 පෙබරවාරි 12 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ නම ලක්ෂ අසූ නම දහස් දෙසිය හතරයි ශත අසූ පහක (රු. 9,989,204.85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.31 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුකහ කෝරළේ, දඹදෙණි හත්පත්තුවේ. නාරම්මල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ රිලිගල අංක 1040 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රිලිගල ග්‍රාමයේ පිහිටි "හෙවනවත්ත නොහොත් බංගලාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. ඩබ්ලිව්. අයි. ජයසේකර යන අය විසින් සාදන ලද 2016 ජූනි මස 03 දාතම හා අංක 2742/16 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : සිරිගල ශ්‍රී පැරකුම්බා පිරිවෙනට අයිති ඉඩම, ගිණිකොනට : අංක 2346 දරන පිඹුරේ ලොට් 2 සහ ගිරිඋල්ල - කුරුණෑගල ප්‍රධාන පාර දක්වා දිවෙන පාර (ප්‍රාදේශීය සභා) (අඩි 12 පළල), දකුණට සහ නිරිතට : එස්. ඒ. එම්. ගුණතිලක යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ වයඹට : සිරිගල ශ්‍රී පැරකුම්බා පිරිවෙනට අයිති ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (A: 0, R: 1, P: 10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 2746/16 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 වඩා නිවැරදිව පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී රිලිගල ග්‍රාමයේ පිහිටි "හෙවනවත්ත නොහොත් බංගලාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. අමරතුංග යන අය විසින් සාදන ලද 2003 අගෝස්තු මස 27 දාතම හා අංක 2346 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : සිරිගල පැරකුම්බා පිරිවෙනට අයිති ඉඩම, ගිණිකොනට : අංක 2346 දරන පිඹුරේ ලොට් 2 සහ පාර සඳහා වෙන්කිරීම (අඩි 12 පළල), දකුණට සහ නිරිතට : එස්. ඒ. එම්. ගුණතිලක යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ වයඹට : සිරිගල ශ්‍රී පැරකුම්බා පිරිවෙනට අයිති ඉඩම සහ මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (A: 0, R: 1, P: 10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 2346 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව T 21/136 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 63/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඒ. ටී. ආර්. ලුවිස්ටන්, වී. ආර්. ෆ්‍රින්ක්ලින්, ආර්. එල්. පවුලා සහ ආර්. එෆ්. ඩයනා.
ගිණුම් අංක : 1128 5707 0580.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැට හතර ලක්ෂ පනස් දහස් දෙසිය හැට හයයි ශත අනූවක (රු. 1,64,50,266.90) මුදලද, 2019 පෙබරවාරි මස 12 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනූ තුන් ලක්ෂයක (රු. 93,00,000) at the rate of Average Weighted Prime Lenging Rate + Three Per centum (3%) Per annum (Floor Rate of 13%) හා තවත් රුපියල් හැට හතර ලක්ෂ හතළිස් දහසක (රු. 64,40,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.24 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පාමන්කඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පාමන්කඩ නැගෙනහිර වෝඩ් අංක 45හි කිරුළපන, මහින්ද පෙදෙස පිහිටි වරිපනම් අංක 45 දරන "ගොඩපරගහඹිවිට, මරංගහවත්ත, බක්මීගහඹිවිට, අඹගහවත්ත, ගොරකාගහවත්ත, ඊරියගහඹිවිට, මිදෙල්ලගහඹිවිට, ඩීඅප්පසිගහඹිවිට, කජුගහඹිවිට, නාගහඹිවිට. හල්ගහඹිවිට. මාදංගහවත්ත හෝ දෙල්ගහකනත්ත, කහටගහඹිවිට, බුලුගහවත්ත, මිල්ලගහවත්ත, කුරුනඹිවිට, ඉඳිගහඹිවිට. කහටගහවත්ත, ගොඩපොරගහවත්ත, කැෂුකහටගහවත්ත සහ බෙල්ලපොකුණවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කනගසිංගම් යන අය විසින් සාදන ලද 2016 මැයි මස 23 දාතම හා අංක 4716 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන්කොට ලොට් M වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1072 දරන එකී පිඹුරේ ලොට් 1485 සහ මහින්ද පෙදෙස (අංක 1072 දරන පිඹුරේ ලොට් 1396), නැගෙනහිරට : මහින්ද පෙදෙස (අංක 1072 දරන එකී පිඹුරේ ලොට් 1396) සහ අංක 1072 දරන එකී පිඹුරේ ලොට් 1483, දකුණට : අංක 1072 දරන එකී පිඹුරේ ලොට් 1483 සහ 1487 සහ බස්නාහිරට : අංක 1072 දරන එකී පිඹුරේ ලොට් 1487 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම පහයි හයක් (A: 0, R: 0, P: 10.56) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 4716 දරන පිඹුරට අනුවය.

එකී ලොට් M වඩා නිවැරදිව පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පාමන්කඩ නැගෙනහිර වෝඩ් අංක 45හි කිරුලපන මහින්ද පෙදෙස පිහිටි "ගොඩපරගහඹිවිට, මරංගහවත්ත, බක්මීගහඹිවිට, අඹගහවත්ත, ගොරකාගහවත්ත, ඊරියගහඹිවිට, මිදෙල්ලගහඹිවිට, ඩීඅප්පසිගහඹිවිට, කජුගහඹිවිට, නාගහඹිවිට. හල්ගහඹිවිට. මාදංගහවත්ත හෝ දෙල්ගහකනත්ත, කහටගහඹිවිට, බුලුගහවත්ත, මිල්ලගහවත්ත, කුරුනඹිවිට, ඉඳිගහඹිවිට. කහටගහවත්ත, ගොඩපොරගහවත්ත, කැෂුකහටගහවත්ත සහ බෙල්ලපොකුණවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. ආර්. නානායක්කාර යන අය විසින් සාදන ලද 1982 ඔක්තෝබර් මස 04 සිට 1984 මැයි මස 11 දක්වා දාතම හා අංක 1072 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1484 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1485 සහ 1396, නැගෙනහිරට : මහින්ද පෙදෙස (ලොට් 1396) සහ එකී පිඹුරේ ලොට් 1483, දකුණට : එකී පිඹුරේ ලොට් 1483 සහ 1487 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1487 සහ 1485 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම පහයි හයක් (A: 0, R: 0, P: 10.56) හෝ හෙක්ටයාර් 0.0267 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1072 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව SPE 104/54 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04 - 63/2

---

LE/RE/208

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**
(HDFC බැංකුව)

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 603500001189.
ණයකරුගේ සම්පූර්ණ නම : සිරිවර්ධන මුදියන්සේලාගේ රිටිගහලන්දේ ගෙදර සෙනෙවිරත්න බණ්ඩා.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2019.03.29 වැනි දින අංක 2117 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2019.03.22 වැනි දින ''ලංකාදීප'' ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණි (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් 2019.05.29 වැනි දින පෙ. ව. 10.00 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 835 දරන උකස් බැදුම්කරය යටතේ රුපියල් අනූතුන් ලක්ෂ විසිනව දහස් හයසිය හැත්තෑපහයි ශත හතරක (රු. 9,329,675.04) මුදලක් වර්ෂ 2019.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූපත් ලක්ෂ හය දහස් අටසිය තිස්නවයයි ශත අනූවක (රු. 8,506,839.90) මුදල ද වර්ෂ 2019.01.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් අට ලක්ෂ විසිදෙදහස් අටසිය තිස්පහයි ශත දාහතරක් (රු. 822,835.14) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූතුන් ලක්ෂ විසිනව දහස් හයසිය හැත්තෑපහයි ශත හතරක් (රු. 9,329,675.04) ක මුදල අයකරගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් අසූපත් ලක්ෂ හය දහස් අටසිය තිස්නවයයි ශත අනූවක (රු. 8,506,839.90) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50%ක් බැගින් වූ පොළිය 2019.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් අට ලක්ෂ දොළොස් දහස් හත්සිය තිස්පහයි ශත දාහතරක (රු. 812,735.14) මුදල මත මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2019.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 56C - බලවල ග්‍රාම නිලධාරි වසමේ, බලවල ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් සාදන ලද කැඩැස්තර සිතියම් අංක 510114 හි කලාප අංක 01 ප්‍රකාර ඉඩම් කොටස් අංක 0091ට මායිම්, උතුරට : කැබලි අංක 73 (අඩි 20 ක් පළල පාර) ද, නැගෙනහිරට : බඩල්ගම සිට මීගමුව දක්වා පාර ද, දකුණට : කැබලි අංක 79 ද සහ බටහිරට : කැබලි අංක 90 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හතයි දශම හතරක (අ. 0, රූ. 01, පර්. 7.4) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි එකයි නවයයි අටක (හෙක්. 0.1198) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහොකළ, පළතුරු ආදී සියලු දේ ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක 000525438428හි පත්ඉරු අංක 000525369088හි ලියාපදිංචි කර ඇත.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. තිලක්සේන විසින් 2017.09.25 වැනි දින ලියා සහතික කරන ලද අංක 835 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

2019 අප්‍රේල් මස 17 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ, ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

05-72

---

**I කොටස : (IIආ) ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි දැන්වීම් සහ I කොටස : I ඡේදය යටතේ පළවන සියලු දැන්වීම් 2019.05.03 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk